රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 24/98

මගේ අංකය :- II/309ඊ107
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

1998.11.12 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**ජනපති පොදුජන සේවයේ රාජකාරියෙහි**
**<u>යෙදීම වෙනුවෙන් දීමනා ගෙවීම</u>**

ජනපති පොදුජන සේවයෙහි නිරතවන අතිකාල අහිමි මාණ්ඩලික නිලධාරීන් සඳහා එසේ රාජකාරියෙහි නිරතවන සති අන්ත හා රජයේ නිවාඩු දින වෙනුවෙන් දීමනාවක් ගෙවීම මෙයින් අනුමත කරනු ලැබේ. එම දීමනාව එක් දිනක් සඳහා මාසික ඒකාබද්ධ වැටුපෙන් 1/20 කට සමාන මුදලක් විය යුතුය. මෙම දීමනාව ගෙවිය යුතු වන්නේ පොදුජන සේවාව පැවැත්වෙන දිනයන්ට අදාලව පමණක් වන අතර, එම එක් එක් දිනයේ පූර්ණකාලීනව සේවයෙහි නිරත වන්නේ නම් පමණි.

02. මෙම දීමනාව ගෙවීම 1998 ජූනි මස 01 වෙනි දින සිට ක්‍රියාත්මක විය යුතුය.

03. මෙම චක්‍රලේඛය, භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

අ.කලේ/(පී.ඒ.සේනාරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය